රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 239

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1984 පෙබරවාරි මස 20 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තියට
යටත්කොට විශ්‍රාම ගැන්වීම

1983.04.12 දින සහ අංක. 218 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. (අ) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබන අවස්ථාවේදී යම්කිසි රජයේ නිලධරයෙකුට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීමට නියමිතව තිබුණේ නම්, හෝ එසේ කිරීමට අදහස් කර තිබුණේ නම්, හෝ (එනම්, චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී) එවැනි රජයේ නිලධරයෙකු සම්බන්ධයෙන්,

(I) නිලධරයාට විරුද්ධව බැලූ මුල් බැල්මට පෙනෙන කරුණු නොමැති අවස්ථාවකදී, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි වගන්තියට යටත්ව කරන ලද විශ්‍රාම ගැන්වීම, සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කළ යුතුය.

(II) නිලධරයාට විරුද්ධව බැලූ මුල් බැල්මට පෙනෙන කරුණු තිබෙන අවස්ථාවකදී, විශ්‍රාම ගැන්වූ දින සිට 06 (හය) මසක් ඇතුළත, විනය බලධරයා චෝදනා පත්‍රයක් නිකුත් කළයුතුය. තම නිදහසට තවත් කරුණු දැක්වීමට ඉන් පසුවට තවත් අවස්ථාවක් නොලැබෙන හෙයින්, හැම අතින්ම අංග සම්පූර්ණ වශයෙන් නිදහසට කරුණු ඉදිරිපත් කිරීම තම වාසියට හේතු වනු ඇතැයි ද, එකී චෝදනා පත්‍රයෙහි වැඩිමනත් වශයෙන් සඳහන් කළ යුතුය. චෝදනා පත්‍රයේ දින සිට මාස 02 (දෙකක්) ඇතුළත, විනය බලධරයා වෙත ලැබෙන පරිදි නිදහසට කරුණු ඉදිරිපත් කළයුතු යයි නිලධරයාට නියම කළයුතුය.

(III) නිලධරයා නිදහසට ඉදිරිපත් කරන කරුණු සතුටුදායක යයි විනය බලධරයා පිළිගන්නේ නම්, සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමකදී පරිදි කටයුතු කළයුතුය.

(IV) නිදහසට ඉදිරිපත් කර ඇති කරුණු අසතුටුදායක යයි ඔහු පිළිගන්නේ නම්, විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කටයුතු නොකළ යුතු අතර, විශ්‍රාම ගැන්වීමේ ලිපිලේඛන සමග පහත සඳහන් කරුණුද ඇතුළත් වාර්තාවක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

(අ) නිදහසට කරුණු කළඩවීමට තුඩුදුන් චෝදනා හෝ කරුණු;

.........../2 පිටුව

(ආ) නිදහසට ඉදිරිපත් කරන ලද කරුණු; සහ

(ඇ) නිදහසට ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් විනය බලධරයාගේ නිරීක්ෂණ.

(V) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිලධරයා වෙත ගෙවිය යුතු යම්කිසි විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් එවැනි දීමනාවක් ගෙවීම අත්හිටවන්නේ ද, හෝ අඩුකරන්නේද හෝ යන්න තීරණය කිරීම සඳහා, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ අවශ්‍ය ලිපි ලේඛණ සමග මා වෙත වාර්තා කරනු ඇත.

(VI) නියම කරන ලද කාලය ඇතුළත නිදහසට කරුණු ඉදිරිපත් කර නොමැත්තේ නම්, ඉහත (V) හි දැක්වෙන පරිදි ක්‍රියා කිරීම සඳහා චෝදනා හෝ නිදහසට කරුණු කැඳවීමට තුඩුදුන් කරුණු විශ්‍රාම වැටුප් ලිපි ලේඛණ සමග විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

(ආ) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබන අවස්ථාවේදී යම්කිසි රජයේ නිලධරයෙකුට විරුද්ධව විනය පරීක්ෂණයක් පැවැත්වීමට නියමිතව තිබුණේ නම්, සහ විශ්‍රාම ගැන්වීමෙන් පසුව, එම විනය පරීක්ෂණය අවසන් කර ඇත්නම් (12 (2) වගන්තිය),

(I) විනය බලධරයා, පරීක්ෂණයේ නිගමන නිලධරයාට ඉදිරිපත් කර, එම නිගමන සම්බන්ධයෙන් ඔහුගේ නිදහසට කරුණු කැඳවිය යුතුය.

(II) විශ්‍රාම වැටුප් ලිපි ලේඛණ සමග පහත සඳහන් දේ විනය බලධරයා විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළයුතුය.

(අ) චෝදනා පත්‍රය,

(ආ) පරීක්ෂණයේ නිගමන,

(ඇ) නිගමන සම්බන්ධයෙන් නිලධරයා නිදහසට යම්කිසි කරුණක් ඉදිරිපත් කර තිබේනම් එය,

(ඈ) ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු සතුටුදායකද නැතහොත්, අසතුටුදායකද යන බවට ඔහුගේ නිරීක්ෂණ.

(III) නිදහසට කරුණු ඉදිරිපත් කර නොමැති නම්, විශ්‍රාම වැටුප් ලිපි ලේඛණ සමග චෝදනා පත්‍රය සහ පරීක්ෂණයේ නිගමන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

(IV) අවශ්‍ය ලිපි ලේඛණ සමග විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ මවෙත වාර්තා කරනු ඇත.

......./ 3 පිටුව

03. විනය පරීක්ෂණයේ නිගමන සම්බන්ධයෙන් නිලධරයා ඉදිරිපත් කර ඇති නිදහසට කරුණු පිළිබඳව, විනය බලධරයා සෑහීමට පත් නොමැති නම්, හෝ නිදහසට කරුණු ඉදිරිපත් කර නොමැති යයි වාර්තා කර ඇති නම්, හෝ, එවැනි නිලධරයෙකුට, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකි විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක්, හෝ වෙනත් දීමනාවක් අහිමිවීම හෝ අඩුකිරීම පිළිබඳව එවිට මම නියෝගයක් කරන්නෙමි.

(ඩී. දී. ඇම්. පී. එස්. සිරිවර්ධන,)
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ
ලේකම්.